**ශීර්ෂය 10 – අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 16 දින කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 409.10 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 317.44 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කොමිෂන් සභාව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 91.66 ක් හෙවත් සියයට 22.40 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 273.40 | 272.58 | 0.82 | 0.30 |
| මූලධන | 135.70 | 44.86 | 90.84 | 66.94 |
| **එකතුව** | **409.10** | **317.44** | **91.66** | **22.41** |

**2.2 අත්තිකාරම් ගිණුම්**

**2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01001 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 5.00 | 4.92 | 3.50 | 4.37 | 20.00 | 14.13 |

**2.2.2 අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරම සඳහා අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කොමිෂන් සභාවට අදාළ විෂය අංක 01002 දරන අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරිම සඳහා අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 150.00 | 2.91 | 1.50 | 3.71 | 275.00 | 18.53 |

**2.3 විගණන නිරීක්ෂණය**

කොමිෂන් සභාවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.2 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.3 වත්කම් කළමනාකරණය**

කොමිෂන් සභාවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනයේ මැදිහත්වීම මත කොමිෂන් සභාවේ විමර්ශන ගොනුවල තොරතුරු පවත්වා ගෙන යාම සඳහා රු.මිලියන 87.16 ක් වටිනා උපකරණ සහිත පරිගණක දත්ත මෘදුකාංග පද්ධතියක් ස්ථාපිත කර තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එහි කටයුතු අවසන් කර නොතිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, එම වාර්තා 2017 ජුනි 01 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. එම චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව අදාළ කාලරාමුව තුළ භාණ්ඩ සමීක්ෂණය කර ඒ අනුව වාර්තා වන ඌනතා හා අතිරික්තතා සම්බන්ධයෙන් 2017 ජුනි 16 දින වන විටත් කටයුතු කර නොතබුණි.

**3.4 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 06 කදී කොමිෂන් සභාව සතු වාහන 05 ක් අනතුරුවලට ලක්වී තිබුණි. එම අනතුරු නිසා සිදු වී තිබුණු අලාභහානි පිළිබඳව මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.5 විදේශාධාර ව්‍යාපෘති**

කොමිෂන් සභාවේ කටයුතුවලට මාස 06 ක කෙටිකාලීන සහයෝගයක් ලබාදීමේ අරමුණින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4.50 ක ආධාර ලබා දී තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 1.82 ක් පමණක් වැයකර තිබුණි. ඒ අනුව රු.මිලියන 2.68 ක් හෙවත් ලබාදී තිබුණු විදේශීය ප්‍රදානයෙන් සියයට 59 ක් ඉතිරි කර තිබුණි. එම වැඩසටහන සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා කොමිෂන් සභාවේ වගකිව යුතු නිලධාරියෙකු පත්කර තිබුණද, අදාළ කාර්යය කාර්යක්ෂමව හා ඵලදායීව ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන සමඟ ඇති කරගෙන තිබුණු ගිවිසුමේ 8, 9 හා 10 ඡේද ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මූල්‍ය හා ප්‍රගති වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

**ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණු ව්‍යාපෘති**

---

2016 මාර්තු 01 දින පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීම් මගින් කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු ඉටු කිරීම සවිබල ගැන්වීම සඳහා රු.මිලියන 123.00 ක මූලධන ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. නමුත් 2016 දෙසැම්බර් 31 දින වන විට ඉන් රු.මිලියන 36.86 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ඉතිරිය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 70 ක් හෙවත් රු.මිලියන 86.14 ක් වී තිබුණි. එම ඉතිරියට පහත සඳහන් කරුණු බලපා තිබුණු බව නිරීක්ෂණය විය.

(අ) දේශීය හා විදේශීය පුහුණු කිරීම් සඳහා රු.මිලියන 30.00 ක ප්‍රතිපාදන සලසා තිබුණද, පුහුණු අවශ්‍යතා පවතින ක්ෂේත්‍රයන් හා පුහුණුව සඳහා යොමු කළ යුතු නිලධාරීන් තෝරා ගැනීමේ ක්‍රමවේදයක් පැහැදිලිව හඳුනාගෙන නොතිබුණි. මේ නිසා පුහුණු වැඩසටහන් සඳහා විධිමත් සැලැස්මක් පිළියෙල කිරීමට නොහැකි වී තිබුණි. මේ හේතුවෙන් සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 20 ක් හෙවත් රු.මිලියන 6.16 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉතිරි කර තිබුණි.

(ආ) තාවකාලික ගොඩනැගිලි කුලියට ගැනීමට හා සීසීටීවී කැමරා පද්ධතිය ස්ථාපිත කිරීමට පිළිවෙලින් රු.මිලියන 30.00 ක් හා රු.මිලියන 8.00 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. නමුත් එම සමස්ථ ප්‍රතිපාදනය සම්පූර්ණයෙන්ම ඉතිරි කර තිබුණි.

(ඇ) ප්‍රාග්ධන හා අනෙකුත් භෞතික පහසුකම් අත්පත් කරගැනීමට සහ වැටලීම් සඳහා අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීමට පිළිවෙලින් රු.මිලියන 25.00 ක් හා රු.මිලියන 30.00 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. අවශ්‍ය අධි තාක්ෂණික උපකරණ පිළිබඳව හා ඒවායේ වෙළඳපල පිළිබඳ නිසි අධ්‍යයනයකින් තොරව හා විධිමත් ප්‍රසම්පාදන සැලැස්මකට අනුව කටයුතු නොකිරීම නිසා රු.මිලියන 55.00 ක් වූ සමස්ථ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක් හෙවත් රු.මිලියන 45.69 ක් ඉතිරි කර තිබුණි.

**3.7 මානව සම්පත් කළමනාකරණය**

---

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 62 | 36 | 26 | - |
| (ii) | තෘතියික මට්ටම | 82 | 27 | 55 | - |
| (iii) | ද්විතියික මට්ටම | 548 | 223 | 325 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 130 | 71 | 59 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 4 | - | 4 |
| | **එකතුව** | **822** | **361** | **465** | **4** |